ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

MA OFFICE - D 01479
By maop3 at 6:29:37 PM, 2/18/2025

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டை, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / எனது இல / My No } MOD/MLO/Tmp/04 (91) (38)

ඔබේ අංකය / உமது இல / Your No }

තැ. පෙ. / த. பெ. / P.O. Box } 572 | දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්/தொ./Fax.: 011 2541529, ඊ තැපෑල/மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date } 2025 පෙබරවාරි 18 දින

MILITARY ASSISTANT OFFICE
1300
18 FEB 2025
1925
ARMY HEADQUARTERS

යුද්ධ හමුදාධිපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති

**<u>අසිරිමත් ස්වර්ණමාලී මහා සෑ වන්දනා මහා පිංකම</u>**

යොමුව: පූජාපිටිය, බටගල්ල, 130/3 ලිපිනයෙහි පදිංචි "ධම්ම නදී තීත්ථ" නිර්මාතෘ සහ ප්‍රධාන සංවිධායක එස්.එස් දේශප්‍රිය මහතා 2025.01.21 දාතමින් යුතුව ආරක්ෂක ලේකම්තුමා වෙත යොමු කර ඇති ලිපිය.

1. යොමුගත ලිපියේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරනු ලබන අතර, අපේක්ෂිතය සඳහා ඔබ සේවාවන් වෙතින් අදාල කාර්යයන් සුදුසු පරිදි ඉටු කර දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

2. තවද, මෙහි සම්බන්ධීකරණ කටයුතු 21 සේනා සේනාංකාධිපති සමඟ සම්බන්ධතාවයෙන් යුතුව සිදු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

AVM

පී එන් ද කොස්තා යුඑස්පී එන්ඩීසී
එයාර් වයිස් මාර්ෂල්
හමුදා සම්බන්ධතා නිලධාරී
ආරක්ෂක ලේකම් වෙනුවට

පිටපත :

එස්.එස් දේශප්‍රිය
130/3
බටගල්ල
පූජාපිටිය

| Military Assistant's Office | |
|---|---|
| COMD | |
| MA | |
| AMA | |
| SO I | |
| SO II (I) | |
| SO II (II) | |
| SO II (III) | |
| CC | 02/18 |
| SC | |

Comd SF(W) / GOC 21

FNA pl in liaison with chief priest Ruwan Welisaya

21/02/25

Lieutenant General
COMMANDER OF THE ARMY



# ස්වර්ණමාලී සෑ රද වන්දනා

ධම්ම නදී තිත්ථ ධර්ම දේශනා මාලාවට වසර 6 පිරීම නිමිත්තෙන්

එස්.එස්. දේශප්‍රිය,
130 3, බටලේල,
ප්‍රජාසිරිය,
2025-01-21

ගරු ආරක්ෂක ලේකම් තුමා,

**<u>අසිරිමත් ස්වර්ණමාලී මහා සෑ වන්දනා මහා පිංකම</u>**

ඉහත නම් සඳහන් අප විසින් ඓතිහාසික කන්ද උඩරට සෙංකඩගල පුරවරයේ සිට සංවිධානය කරනු ලබන සරල ධර්ම කරුණු කාරණා සිට ගැඹුරු ධර්ම කරුණු සාකච්ඡා කරනු ලබන ධර්ම දේශනාවක් ලෙසින් "ධම්ම නදී තිත්ථ" ධර්ම දේශනා මාලාව මීට වසර 06 කට පූර්ව ආරම්භ කරන්නට යෙදුනි. මෙම උතුම් දේශනා මාලාව ලෝකවාසී සියලු දෙනාට ශ්‍රවණය පිණිස බෞද්ධයා ගුවන් විදුලිය ඔස්සේ සෑම සිකුරාදා දිනකම රාත්‍රී 9.00 ටත් නැවත විකාශය ලෙස ඉරිදා උදෑසන 9.00 ටත් අඛණ්ඩව විකාශන දායකත්වයන් ලබාදෙමින් කටයුතු කරගෙන යනු ලබයි.

වසර 06 ක් සපිරෙන 2025 පෙබරවාරි මස 22 සෙනසුරාදා අනුරාධපුර ස්වර්ණමාලී චෛත්‍ය රාජයාණන් වහන්සේ අභියස "ස්වර්ණමාලී මහා සෑ වන්දනා" නමින් මහානීය වැඩසටහනක් මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක ස්වාමීන් වහන්සේ අනුනායක ස්වාමීන් වහන්සේලා දෙනම, අටමස්ථානාධිපති නායක ස්වාමීන් වහන්සේ, බෞද්ධයා නාලිකාවේ ගරු සභාපති, නායක ස්වාමීන් වහන්සේ ඇතුළු ගරුතර මහාසංඝරත්නය සහභාගිත්වයෙන් මෙම උතුම් පිංකම සංවිධානය කරනු ලබයි.

එදින සිදුකරනු ලබන පිංකම් :

1. ස්වර්ණමාලී චෛත්‍ය රාජයන් වහන්සේට කංචුක පූජාව සහ මහා සෑය මලින් සැරසීම.
2. පරිවාර චෛත්‍ය රාජයන් වහන්සේලා 04 නමට කංචුක පූජාව
3. චෛත්‍යරාජයන් වහන්සේ සියළුම පේසා වළලු විදුලි ආලෝකයෙන් ආලෝකමත් කිරීම.
4. චෛත්‍යරාජයන් වහන්සේ උදෙසා ගුවනින් මල් ඇමීම. (ශ්‍රී ලංකා ගුවන් හමුදාව)
5. ස්වර්ණමාලී චෛත්‍ය රාජයන් වහන්සේට ඇතුළු වන ස්ථානයේ සිට මහා සැරදුන් අභියස දක්වා විදුලි ආලෝක වියනක් යෙදීම.
6. ශබ්ද පූජාවන් සමඟ වැලි මළුවේ වප්පත කොටස මෙම උතුම් පිංකම සඳහා ප්‍රදානය කිරීමට අපේක්ෂා කරමි.
7. විචිත්‍රවත් මල් සැරසිලි, කංචුක පූජා, ඖෂධ 108 ක් සහිත ඖෂධ පූජාව, ගුවනින් මල් ඇමීම, මහාරූ පරිශ්‍රයක් නිර්මාණය කරමින් මෙම උතුම් පිංකම 2025 පෙබරවාරි 22 වන සෙනසුරාදා සවස 4.00 සිට පුරා පැය 06 ක් ලෙසින් උත්සව සභාව ආරම්භ වී අනතුරුව බුද්ධ වන්දනාව සහ පුරා පැය 03 ක් සම්බුදු ගුණ වරුණ දේශනාව පවත්වනු ලබයි.

- **මෙම පිංකමේ අරමුණ විශේෂයෙන්ම ජනාධිපතිතුමා ඇතුළු පවතින රජයටත්, ලක්වාසී සියලුම ජනතාවටත් සෙත්පතා ආශිර්වාද කිරීම.**

- **එසේම මියගිය විරෝධාර රණවිරුවනන්ට සහ දැනට සේවයේ සිටින රණවිරුවන්ට පිංපෙත් අනුමෝදන් කිරීම.**

මෙම උතුම් පිංකම සඳහා උතුර මැද පළාතේ දැනට සේවය කරනු ලබන ත්‍රිවිධ හමුදා රණවිරුවන් මෙම උතුම් කර්තව්‍යයට සහභාගීකර ගැනීමට අදහස් කරන අතර, ඒ සඳහා එම බල ප්‍රදේශයේ නිලධාරී මහත්මයෙකු අප හට සම්බන්ධ කර දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. එසේම රණවිරුවන් පූජවකින් සැරසී මෙම අවස්ථාවට සහභාගිවීම අප අගය කොට සලකමි. එසේම සහභාගී වන සියළුම ත්‍රිවිධ හමුදා රණවිරුවන්ට සංග්‍රහ කටයුතු නොමසුරුව සපයනු ලබන බවත් මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

D.G.J.J. Deshappriya

.........................................
එස්.එස්. දේශප්‍රිය
"ධම්ම නදී තිත්ථ" නිර්මාතෘ සහ ප්‍රධාන සංවිධායක

...ප්‍රිය
Email : ssdeshappriya1976@gmail.com